**පොරතිවුපත්තු ප්‍රාදේශීය සභාව - 2021**

---------------------------------------------

**1 මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---------------------------

පොරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පොරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | |
|---|---|---|
| සභාවේ ගබඩා ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් තොගය රු. 1,307,454 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල ගබඩා තොග වටිනාකම දක්වා නොතිබුණි. | ඉදිරියේදී අවසන් තොගය වත්කමක් වශයෙන් පෙන්වීමට කටයුතු කරනු ලැබේ. | අවසන් තොග ගණනය කර ගිණුම්ගත යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු. 47,176,215 ක් වටිනා වත්කම් ශේෂ 04 ක් සම්බන්ධයෙන් ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය<br>වත්කම් ලේඛන, අයිතිය තහවුරු කිරීමේ ලියවිලි විගණනට ඉදිරිපත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් තක්සේරු කිරීමටද වාහනවල අයිතිය පවරා ගැනීමටද අවශ්‍ය කටයුතු කර ඇත. | වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 35,954,444 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,423,315 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දක්වා ඇත.

| විගණන නිරීකෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට රු. 309,200 ක් මහජන පොල හිඟ බදු කුලී ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | ඉකුත් කාල පරිච්ඡේදයට අදාල මහජන පොල බදු කුලී අයකර කර ගැනීමට කටයුතු කර ඇත. | හිඟ මුදල අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීකෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල වර්ෂ කීපයක සිට බැංකු ශේෂය යටතේ හිටපු ලේකම්ගේ මුදල් වංචාවක් ලෙස රු. 172,419 ක මුදලක් දක්වා තිබුණද, එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිටපු ලේකම්ගේ මුදල් වංචාවට අදාල නඩුව උසාවියේ විභාග වෙමින් පවතින බැවින් අයකර ගැනීමට නොහැකිව ඇත. | නඩු තීන්දුව අනුව කටයුතු කළ යුතුය. |

**3.2 ව්‍යාපෘති, ක්‍රියාකාරකම් සහ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ වැසිකිළි අළුත්වැඩියා කිරීම, මාර්ග සඳහා නාම පුවරු සවිකිරීම සහ ළමා උද්‍යාන ඉදිකිරීම් යන කාර්යයන් නිමකළ බවට වාර්තා ඉදිරිපත්කර 2017 වර්ෂයේ මුදල් ලබාගෙන තැන්පත් කර තිබූ මුදලින් රු. 750,000 ක් වටිනා ව්‍යාපෘති විගණන දිනයවන 2021 අප්‍රේල් 05 දින දක්වා ආරම්භ කර නොතිබුණි. | යෝජිත ස්ථාන මාරු කරන ලෙස සභාපති විසින් බල කිරීම නිසා එම කර්මාන්තය නිමකිරීමට නොහැකි විය.මෙහි ව්‍යාපෘතියට අදාල මුදල් ප්‍රයෝජනයට නොගෙන ආපහු යැවීමෙන් වැළකීම සඳහා නිමකළ බව සඳහන් කර ඇත. මෙම කර්මාන්තය ඉදිරි වර්ෂයේදි නිම කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | ව්‍යාපෘති අදාල කාල පරිච්ඡේදය තුල ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ පැවති තනතුරු 11 කට අදාල පුරප්පාඩු 22 ක් පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි. | අප සභාවේ පුරප්පාඩු සම්බන්ධයෙන් පළාත් පාලන ආමාත්‍යාංශයට සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලයට දැනුවත් කළද මෙතෙක් පිරවීමට කටයුතු කර නොතිබුණි. | තනතුරු පුරප්පාඩු පිරවීමට සඳහා නැවත අදාල අංශ දැනුවත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාවේ සේවකයන් 06 දෙනෙකුට ලබා දී තිබූ රු. 503,195 ක් ආපදා ණය සහ වෙනත් ණය මුදල් වර්ෂ 20 කට අධික කාලයක සිට අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | සභාවේ සේවය කළ සේවකයන් 06 දෙනෙකුගේ හිඟ මුදල 2000 වර්ෂයට පෙර සිට ඉදිරියට එන හිඟ මුදලකි. මෙම සේවකයන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට නොහැකිව ඇත. මෙම සම්බන්ධයෙන් සහකාර පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ලබා ගෙන ඒ අනුව ඉදිරි කටයුතු කරනු ලැබේ. | සේවක ණය හිඟ මුදල අයකිරීමට හෝ අදාල පරිදි කටයුතු කිරීමට ක්‍රියාකළ යුතුය. |

**4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 විගණන කමිටු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක DMA/2009(1) සහ 2009 ජූනි 09 වන දින විගණන මාර්ගෝපදේශක චක්‍රලේඛය අනුව සභාව විසින් විගණන සහ කළමනාකරණ කමිටු ආරම්භ කර රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන සහ කළමනාකරණ කමිටු පිහිටුවා ඇතත් රටේ පැවති කෝවිඩ් වසංගතය හේතුවෙන් රැස්වීම් පවත්වීමට නොහැකි විය. | විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පැවත්වීමට කටයුතු කළ යුතුය. |

**4.2 තිරසාර සංවර්ධන ඉලක්ක**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2017 අංක 19 දරණ තිරසාර සංවර්ධන පනත අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකළ යුතු සංවර්ධන න්‍යායපත්‍රය අනුව එය මැනීම සඳහා දර්ශක හඳුනාගෙන ක්‍රියාකිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | ඉදිරියේදී තිරසාර සංවර්ධන දර්ශක හඳුනා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | තිරසාර සංවර්ධන දර්ශක හඳුනා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |